**ශීර්ෂය 304 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොන්ගල රේඩාර් පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 2007 වර්ෂයේදී රු. මිලියන 403 ක් වැයකර තිබුණද එහි කටයුතු අවසන්ව නොතිබුණි. එම කාර්යය සඳහා ලෝක කාලගුණ විද්‍යා සංගමයේ භාරකාර අරමුදලේ තැන්පත් කර තිබූ රු.මිලියන 322 ක් නැවත දෙපාර්තමේන්තුවට ගෙන්වාගෙන ඉන් රු.මිලියනයක් වියදම් කර ඉතිරි මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම හා රු.මිලියන 9 ක් වටිනා උපකරණ අස්ථානගත වීම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | ලැබුණු මුදල් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර ඉල්ලුම් කර තිබූ අක් මුදල් නොලැබීම නිසා රු. මිලියනයක් තබාගෙන ඉතිරි මුදල් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇත. ඩොප්ලර් රේඩාර් පද්ධතියට අදාල උපකරණ ඉන්වෙන්ට්‍රිගත කර නොතිබීම නිසා කපා හැරීමක් සිදුකර නැත. | මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත මෙම වත්කම් හා ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.2** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ පොත් අනුව අත්තිකාරම් ලැබීම් රු.10,876,363 ක් සහ අත්තිකාරම් ගෙවීම් රු.5,012,143 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය පිළිවෙලින් රු.9,956,153 ක් හා රු.4,100,933 ක් ලෙස දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් ලෙස දක්වා ඇත්තේ මූල්‍ය ප්‍රකාශයෙහි ACA5 හි වර්ෂය තුල බැරකිරීම්වල එකතුව සහ වර්ෂය තුල හර කිරීම් එකතුවට හර ශේෂ උපරිම සීමාහි ඍණ ශේෂය ගලපා ගැනීමෙනි. | විධිමත් පරිදි ගිණුම් තැබිය යුතුය. |

### 1.6.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිලධාරින් තිදෙනෙකුගෙන් අයවිය යුතු ණය එකතුව අත්තිකාරම් ලේඛණය අනුව රු.191,548 ක් වුවද, ගිණුම් අනුව රු.121,548 ක් වු බැවින් රු.70,000 ක වෙනසක් විය. | වැටුප් මෘදුකාංගය අනුව නිවැරදිව අයකරගෙන ඇති අතර $cc_{10}$ ලේඛනය නිවැරදිව සටහන් කර ගන්නා ලද බව දන්වමි. | ආපදා හා උත්සව අත්තිකාරම් ශේෂ ලේඛන වල හා මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ඉදිරිපත් කළ යුතු වේ. |

### 1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර නොතිබුණි. | යාවත්කාලීන කිරීමට කටයුතු ආරම්භ කර ඇති බව දන්වමි. | ස්ථාවර වත්කම් ලේඛනය විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |
| (ආ) $CC_{10}$ ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙළ කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | ඉදිරියේදී $CC_{10}$ ආකෘතියට මෙම ණය වර්ගද ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව $CC_{10}$ ආකෘතිය පදනම් කරගෙන ණය සහ අත්තිකාරම් ලේඛන පිළියෙළ කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් වලින් ශුද්ධ ප්‍රතිපාදනය රු.25,852,460 හෙවත් සියයට 7.08 ක් උපයෝජනය කර නොතිබුණි. | වියදම් සම්පූර්ණ ලෙස සිදු නොකිරීම හා පැවති කෝවිඩ් 19 තත්ත්වය යටතේ සිදු වූ ප්‍රමාදයන් බලපාන ලදී. | භාණ්ඩාගාර ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) පුනරාවර්තන වැය විෂයන් 05 ක සියයට 21 සිට සියයට 51 ක පරාසයක ද, ප්‍රාග්ධන වැය විෂයන් 05 ක සියයට 35 සිට සියයට 89 ක පරාසයක ද ඉතිරිවීම් විය. | කෝවිඩ් වසංගතය හේතුවෙන් බලාපොරොත්තු වූ වියදම් උද්ගත නොවීම, රේඩියෝසොන්ට් උපකරණ නැව්ගත කිරීම ප්‍රමාදවීම පුනරාවර්තන වියදමේ ඉතිරියට හේතුවේ. ප්‍රධාන කාර්යාලය බදුල්ල හා නුවරඑළිය කාලගුණ විද්‍යා කාර්යාලයෙහි භූමිය වැඩිදියුණු කිරීමේ කටයුතු දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැරවීම. | -එම- |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත් අනුව වැය විෂයයන් 07 ක බැරකම් එකතුව රු.1,199,611 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | 2020 පෙබරවාරි 12 මූල්‍ය ප්‍රකාශන අත්සන සඳහා යොමු කරන ලද බැවින් එදිනට ඉදිරිපත් වූ බැරකම් පමණක් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර ඇති අතර එදිනට පසුව ඉදිරිපත් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන තුලට ඇතුළත් කිරීමට නොහැකි විය. | වර්ෂයට අදාල සියළුම බැරකම් මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කළ යුතු වේ. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1999 හා 2010 වර්ෂයේ සේවය හැරගිය සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු 135, 922 ක් සහ විශ්‍රාම ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.54,868 ක් 2020 මාර්තු 16 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | රු.135,922 ක ණය ශේෂ කපා හැරීම සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. විශ්‍රාම ගිය නිලධාරියාගේ විශ්‍රාම ප්‍රදාන පත්‍රය 2021 මාර්තු 16 වන විට ගිණුම් අංශය වෙත ලැබී නොමැති බව දන්වමි. | සේවය හැරගිය නිලධාරින්ගේ සහ විශ්‍රාම ගිය නිලධාරියාගේ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීතිරීති රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 396 | මාස 06 ඉක්ම වූ එකතු වටිනාකම රු.41,212 ක් වූ චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකතුව රු.38,370 ක් වටිනා චෙක්පත් දෙකක් සඳහා 2020 ජූලි 30 හා 2020 ජූලි 03 දින නව චෙක්පත් දෙකක් නිකුත් කර ඇති බව දන්වමි. | මාස 06 ඉක්ම වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | අවුරුදු 2 ක් ඉක්ම වූ තැන්පතු රු.249,219 ක් අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැරකිරීමට කටයුතු කර නොතිබුණි. | තැන්පතු වලින් රු.70,000 ක් ඇප තැන්පතු වන අතර ඉතිරි තැන්පත් පිලිබදව මු.රෙ 571 පරිදි කටයුතු කර ඇත. | අවුරුදු 2 ක් ඉක්ම වූ තැන්පතු සම්බන්ධ මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 1646 | 2016 වර්ෂයේ සිට වාහන 07 ක ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 වන දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට මාසික සාරාංශ ඉදිරිපත් කරන බවත් දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මාසික සාරාංශ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | **1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත** | | | |
| | 28 ආ (2) (ආ) හි 8 (එ) (i) වගන්තිය | දෙපාර්තමේන්තුවේ ඉදිරිපස වැට නාගරික සංවර්ධන අධිකාරියේ අවසර පත්‍රයක් ලබා නොගෙන ඉදිකර තිබුණු බැවින් ඉඩම අධිකාරිය සතු කරගතහොත් කිසිදු වන්දියක් ලබාගැනීමට හිමිකමක් නොමැති තත්වයක් පැවතිණි. | මෙම ඉදිකිරීම සඳහා සැලසුම් සකස්කිරීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ඉංජිනේරු සහය ලබා ගන්නා ලදි. එහිදී ප්‍රමාණපත්‍ර සැලසුම් හා මිලගණන් පිළිබඳ උපදෙස් ලැබුණද, මෙම අවසරය ලබාගැනීම සඳහන් වී නොතිබුණ නිසා එලෙස අවසර ලබාගෙන නැත. | නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධන) පනතට අදාල අවසර පත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | 2016 දෙසැම්බර් 26 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | |
| (i) | 3.1 ඡේදය | සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුව සතු වාහන 09 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | 2021 වර්ෂයේදී ඉන්ධන පරීක්ෂාව කිරීමට කටයුතු කරන බවත් පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් එම කටයුතු සිදු කිරීමේ අපහසුතා පැන නැගී ඇති බව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 4.4 ඡේදය | චක්‍රලේඛයට පටහැනිව කොළඹ නගර සීමාවේ තිබෙන වාහන අළුත්වැඩියාව නගර සීමාවෙන් පිටත පිහිටි ආයතන වලින් සිදුකර තිබුණි. | මින් ඉදිරියේදී චක්‍රලේඛයේ දක්වා ඇති ප්‍රදේශවල පිහිටි ගරාජ වලින් අළුත්වැඩියා කටයුතු සිදුකරන බව දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවස්ථා 13 කදී වියදම සියයට 20.19 ක සිට සියයට 283.14 ක පරාසයක් අවශ්‍යතාවය ඉක්මවා ලබා දී තිබු අතර ලබා ගත් අත්තිකාරම් කාර්යය නිම වු විගස පියවිය යුතු වුවද අවස්ථා 07 කදී මාස 1 සිට මාස11 ක ප්‍රමාදයක් සහිතව පියවීම් සිදුකර තිබුණි. | අත්තිකාරම් ලබා ගැනීමේදී වියදම් ප්‍රමානය නිර්ණය, නිශ්චිත ඇස්තමේන්තු කිරීම ප්‍රායෝගිකව සිදු කිරීම අපහසු බැවින් මෙවැනි අවස්ථා ඇති විය හැක. | අවශ්‍යතාවයට ප්‍රමානවත් පරිදි අත්තිකාරම් ලබා ගැනීම හා ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් ආපසු පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හැකියා වර්ධනය වෙනුවෙන් කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සඳහා වෙන් කළ රු.මිලියන 1.37 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 0.63 ක් හෙවත් සියයට 5 පමණ වැයකර තිබුණි. ඩොප්ලර් කාලගුණ රේඩාර් පද්ධති ව්‍යාප්තිය මුල්‍ය ප්‍රගතිය සියයට සියයක් වුවද භෞතික ප්‍රගතිය සියයට 16 ක් විය. අකුණු හඳුනාගැනීමේ පද්ධතිය වෙනුවෙන් (**lightning detection system**) රු.මිලියන 2.20 අයවැය ප්‍රතිපාදන සලසා තිබුණ ද සත්‍ය මුදල් වැය කිරීම රු.මිලියන 0.25 ක් හෙවත් සියයට 11.36 ක් විය. | ඩොප්ලර් රේඩාර් පද්ධතිය සඳහා කාර්තුවක් සඳහා වියදම එම කාර්තුවේ ප්‍රතිපාදන ලෙස සලකා 2020 වර්ෂය සඳහා ගණනය කර ඇත. කොරෝනා වසංගතය හේතුවෙන් ජපන් පාර්ශවයේ කටයුතු අක්‍රීය වීම හේතුවෙන් භෞතික ප්‍රගතිය සියයට 16 ක් විය. | ප්‍රතිපාදන උපයෝජනය කරගෙන ක්‍රියාකාරි සැලැස්මට අනුව කටයුතු කළ යුතුය. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ඉදිරිපස වැට හා ගේට්ටුව ඉදිකිරීමේ දී සැලකිය යුතු අඩුපාඩු සිදු වී තිබුණ ද අවසන් බිල්පත සඳහා රු.3,277,459 ක් ගෙවා තිබුණි. | තාක්ෂණික කමිටුවේ නිර්දේශ පරිදි ගෙවීම් කර ඇත. | ඉදිකිරීම් කටයුතු සැලැසුම් කරන ලද පරිදි ක්‍රමවත්ව ඉටු කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 ප්‍රසම්පාදනයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 (ඇ) පරිදි 2020 වර්ෂ සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛන අංක 01/2014 අනුව ප්‍රසම්පාදන සැලැස්ම සෑදීම අනිවාර්ය වේ. එම අනිවාර්ය ප්‍රසම්පාදන සැලැස්ම 2020 වර්ෂය සඳහා සකසා ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති අනිකුත් ප්‍රසම්පාදන සැලසුම් සෑදිම අනිවාර්ය නොවන බව දැක්වේ. | විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වේ. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යක්ෂකගේ විධිමත් අනුමැතියකින් තොරව ධාවනය කර තිබූ වාහනයකට සිදු වී තිබූ අනතුරක් සම්බන්ධ විමර්ශනයක් පවත්වා 2020 ජුලි 18 දින වාර්තාවක් ලබා දී තිබුණද, විධිමත් පරීක්ෂණ කටයුතු 2021 අප්‍රේල් වන විටත් සිදු කර නොතිබුණි. | 2020 මැයි 15 හා 17 දෙදින සිදු වූ අනතුර සම්බන්ධව විමර්ශනය රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් සිදුකරනු ලබන බැවින් විධිමත් පරීක්ෂණ කටයුතු අවසන් නොකිරීම අපගේ පාලනයෙන් බැහැර වේ. | වාහන ධාවනයට අදාල අනුමැතිය ලබා ගත යුතු වුවත් වාහන අනතුරු සම්බන්ධ පරීක්ෂණ විධිමත් කළ යුතුය. |

**3.5** **කළමනාකරණ දූර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අයහපත් කාලගුණය පිළිබඳ පූර්ව අනතුරු ලබාදීමේ ක්‍රමවේදයට පිටුවහලක් ලබා ගැනීම සඳහා ඩොප්ලර් රේඩාර් පද්ධති පුත්තලම හා පොතුවිල් කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල පිහිටුවීමට, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය මගින් ජපන් යෙන් මිලියන 2,503 ක ප්‍රදානයක් ලබාදීමට එකඟ වී තිබුණි. මේ වෙනුවෙන් 2017 ජුනි 30 දින ශ්‍රී ලංකා රජය අතර ගිවිසුමක් අත්සන් කර වර්ෂ 04 ක කාලයක් ගත වී තිබුණ ද, මෙතෙක් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. | ආරම්භයේදී ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයන් සිදු වී ඇති බව පෙනේ. 2019 වසරේ සිට කඩිනමින් කටයුතු කර ඇත. නමුත්, කොරෝනා වසංගත තත්ත්වය යටතේ නැවතත් 2020 වර්ෂයේදී ප්‍රමාදයන් සිදු වී ඇත. නමුත්, දෙරටෙහි පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ජපානයේ ඩොප්ලර් යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීම 2021 අගෝස්තු දක්වා කල් යන බව **JICA** ආයතනය මගින් දැනුවත් කර ඇත. | පුත්තලම හා පොතුවිල් රේඩාර් පද්ධතිය ප්‍රමාදයකින් තොරව ඉදි කිරීමට කළ යුතුය. |
| (ආ) | මිනවාටා සම්මුතිය ප්‍රකාරව 2020 වර්ෂයෙන් පසු රසදිය අඩංගු නිෂ්පාදන ආනයනය හෝ අපනයනය නොකල යුතු බව දක්වා තිබුණ ද විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2020 ජූලි 22 වන විටත් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යාල 23 ක රසදිය උපකරණ 139 ක් ද දෙපාර්තමේන්තුවට සහාය වන පිටස්තර මධ්‍යස්ථාන 33 ක රසදිය උපකරණ 264 ක්ද භාවිතයට ගනිමින් තිබුණි. | රසදිය අඩංගු උපකරණ භාවිතයෙන් ඉවත් කිරීම සඳහා දිනයන් නිශ්චය කර නැත. | රසදිය භාවිතය ක්‍රමානුකූලව අවම කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සැම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණු අතර තිරසර සංවර්ධන උපාය මාර්ගික ක්‍රියාකාරි සැලැස්ම දෙපාර්තමේන්තුව විසින් සකසා අවසන් කිරීම හා දත්ත ගබඩා කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි. තවද තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟා වීමේ ප්‍රගතිය වාර්තා කර නොතිබුණි . | ගෝලීය ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ඇත. අපගේ රේඛීය අමාත්‍යාංශය මගින් අදාළ කටයුතු හා ඉදිරි පියවරයන් පිළිබඳ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන බව දන්වා සිටින අතර, පවතින කොරෝනා වසංගත තත්ත්වය මත එම වැඩසටහන මේ දක්වා පැවැත්වීමට නොහැකි විය. | තිරසර සංවර්ධනයට අදාල කාර්යයන් ඉටු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩල 460 ක් වුවද සේවයේ නියුතු කාර්යය මණ්ඩලය 343 ක් වූ බැවින් කාර්යය මණ්ඩල පුරප්පාඩු 117 ක් විය. අධිසේවක පදනම මත බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ කාලගුණ විද්‍යා නිලධාරීන් 03 දෙනෙකු සේවයේ නියුතුව සිටි. තවද දෙපාර්තමේන්තුව සඳහා මානව සම්පත් සැලැස්මක් සකසා නොතිබුණි. | නවු තීන්දුවක් අනුව අධි සේවක පදනම මත කාලගුණ විද්‍යාඥයන් බඳවා ගෙන ඇත. කාලගුණ විද්‍යා නිරීක්ෂණ/සන්නිවේදක තනතුර සඳහා 2021 මැයි 07 වන විට අළුතින් 27 දෙනෙකු බඳවා ගෙන ඇත. ඉදිරි වසර දෙක තුළ පුරප්පාඩු සම්බන්ධව දළ වශයෙන් ගණන් බලා විභාගය පැවැත්වීම මගින් මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීම ඉක්මන් කළ හැක. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතුය. |
| (ආ) අභ්‍යන්තර විගණක තනතුර 2013 වර්ෂයේ සිට 2019 ජුලි 01 දින දක්වා පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු පුරවන ලෙස ඉල්ලා ඇත. | අභ්‍යන්තර විගණක තනතුරේ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |